මැතිවරණ දෙපාර්තමේන්තුව
தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk   e-mail : info@slelections.gov.lk*

| | | |
|---|---|---|
| මගේ අංකය : PE/**24/2015**<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : **2015.07.27**<br>திகதி |

වකුලේඛ අංක -TR/2015/10

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා**
**සියළුම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත,**

<u>පාර්ලිමේන්තු මැතිවරණය - **2015.08.17**</u>
<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, සහකාර තේරීම් භාර නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා නිල වාහන (Assigned Vehicles ) රැගෙන යාම</u>

**2015.08.17** දින පැවැත්වීමට නියමිත ඉහත ඡන්ද විමසීමේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී හෝ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්වීමක් ලබා ඇති නිලධාරීන්ට තමාට හිමි නිල වාහනයක් තිබේ නම් එම නිල වාහනය තම කාර්යාලය / නිවසේ සිට තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාම සඳහා භාවිතා කිරීම අනුමත කරමි. ඒ සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර ඒ සඳහා භාවිතා කළයුතු V-6 ආකෘතිය මේ සමග ඇත.

02. තම නිල වාහනය රැගෙන යන නිලධාරීන් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණයට <u>අවශ්‍ය ඉන්ධන තම පෞද්ගලික මුදලින් ලබාගෙන අදාළ බිල්පත් මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කල පසු එම මුදල ප්‍රතිපූර්ණය කරනු ඇත. මෙම නිලධාරීන් තම කාර්යාලයෙන් හෝ තේරීම්භාර නිලධාරීන්ගෙන් ඉන්ධන ලබා ගැනීම සිදු නොකළ යුතුය.</u> වෙන්කළ වාහනයක් භාවිතා කිරීමට හිමිකම් ඇති නිලධාරියෙකුට වෙන්කර ඇති වාහනය ඔහුගේ පෞද්ගලික වාහනය සේ සළකා කටයුතු කළ හැකිය.

03. මැතිවරණ රාජකාරිය සඳහා නියමිත දිස්ත්‍රික්කයට යාමට අවශ්‍ය ඉන්ධන සඳහා ඔබට වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා මේ සමග අමුණා ඇති AV-I ආකෘතිය සම්පූර්ණ කර අදාළ බිල්පත් සමඟ සම්පූර්ණ කරන ලද පොදු 35 වව්චරයක් ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව මැතිවරණ මහලේකම් කාර්යාලයට එවීමට කටයුතු කරන්න. ඡන්ද විමසීමේ රාජකාරීන්හි නිරත වූ නිලධාරීන්ට කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් කරන ආකෘති වල ඉන්ධන ලබාගැනීමට වැය වූ මුදල ප්‍රතිපූර්ණ කරගැනීමේ ඉල්ලීම් ඇතුලත් නොකළ යුතුය. නිල වාහනය රැගෙන යාමේදී රජයේ රියදුරෙකු යොදවා ගත යුතු අතර ඒ සඳහා වූ ගෙවීම් උපදෙස් ඉදිරියේදී මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛය මගින් ලබා දෙනු ඇත. මෙම රියදුරන්ගේ පැමිණීමේ සහතිකය ලෙස **CE 51** පත්‍රිකාව ලබා ගත යුතුය.

04. උපදෙස් පන්ති වලට සහභාගිවීම පිණිස තම පෞද්ගලික වාහනය යොදා ගන්නා නිලධාරීන් එසේ පෞද්ගලික වාහනයකින් පැමිණි බවට පැමිණීමේ සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් ගමන් කල දුර ප්‍රමාණය වෙනුවෙන් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ නියමයන්ට අනුව සැතපුම් කුළිය ලබා ගත හැකිය. තවද පෞද්ගලික පාවිච්චිය සඳහා ද වෙන්කල නිල වාහන භාවිතා කරන නිලධාරීන්ට ඉන්ධන අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන් උපදෙස් පන්ති කැඳවීම් සිදුකළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් හරහා ලිඛිතව මැතිවරණ කොමසාරිස් විමසීම යෙහෙකි.

05. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත යැවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සළකමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්

පිටපත් :-

1. විගණකාධිපති - දැනගැනීම සඳහා
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු) - දැනගැනීම සඳහා
3. සියළුම තේරීම් භාර නිලධාරී/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් - අවශ්‍ය අනුමැතිය ලබා දීමට හා දැනුවත් කිරීම සඳහා
4. ප්‍රධාන ගණකාධිකාරී - දැනගැනීම සඳහා
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා
6. ගණකාධිකාරී (ප්‍රසම්පාදන) - සෑම දිස්ත්‍රික්කයටම අවශ්‍ය තරම් CE 51 පත්‍රිකා ලබා දීමට
7. ගණකාධිකාරී (ගෙවීම්) - දැනගැනීම සඳහා


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*

අනුමැතිය සඳහා පිටපත් 02 ක් සම්පූර්ණ කර අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී /ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත යවන්න.

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17
## නිල වාහන හිමි නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා තම නිල වාහන රැගෙන යාමට අනුමැතිය ඉල්ලීම

1. නිලධාරියාගේ නම : ........................................................................................................
2. තනතුර : ........................................................................................................
3. කාර්යාලයීය ලිපිනය : ........................................................................................................
4. වාහන අංකය : ................................ වාහන වර්ගය : කාර් /කැබ් / ජීප්
5. වාහනය පෙට්‍රල් ද ඩීසල් ද යන වග : පෙට්‍රල් ☐ ඩීසල් ☐
6. ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කය : ........................................................
7. රාජකාරි සඳහා පත්කර ඇති තනතුර : ප්‍ර.ග.නි ☐ ස.තේ.නි ☐
8. කාර්යාලයීය දුරකථන අංකය : ........................................................................................................
9. ෆැක්ස් අංකය : ........................................................................................................

ඉහත අංක දරණ මාගේ නිල වාහනය ................................................................ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පැමිණීම පිණිස යොදා ගැනීමට අනුමැතිය පතමි.

දිනය : ........................................ ..............................................................

ඉල්ලුම් කරන නිලධාරියාගේ අත්සන

ඉහත නම් සඳහන් නිලධාරියාගේ අංක ........................................................... දරණ නිල වාහනය මෙම දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පැමිණීමට යොදාගැනීම අනුමත කරමි.

දිනය : ........................................ ..............................................................

දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී /ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/
නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්
............................................ දිස්ත්‍රික්කය.

*සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන)
අනුමත කිරීමෙන් අනතුරුව මෙහි එක් පිටපතක් ගොනුකර තබාගත යුතු අතර, අනෙක් පිටපත නිලධාරියා වෙත යැවීමට කටයුතු කරන්න. (ෆැක්ස් කිරීම වඩාත් යෝග්‍ය වේ.)

සැ.යු. නිලධාරියා තම පෞද්ගලික මුදලින් ඉන්ධන ලබාගත යුතු අතර එය මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කරනු ඇත.

★ අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න
★ අනවශ්‍ය වචන කපා හරින්න.

# පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17

## ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි / සහකාර භාරකාර නිලධාරි විසින් රැගෙන යන ලද *(නිල වාහන) (Assigned Vehicle) වලට ලබාගත් ඉන්ධන සඳහා වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කරගැනීම.

අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ නම :

ෆැක්ස් අංකය:

ලිපිනය :

දුරකථන අංකය :

| 01 | 02 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| නිලධාරියාගේ නම | තනතුර | වාහන අංකය | ඡන්ද විමසීමේ රාජකාරි සඳහා ගිය දිස්ත්‍රික්කය හා වාර්තාකල දිනය | එම දිස්ත්‍රික්කයට යාමට හා ආපසු පැමිණීමට ධාවනය කළ කි.මී. ගණන | ඔබ විසින් මුදල් ගෙවා ලබාගත් ඉන්ධන ප්‍රමාණය ලීටර් | ඉන්ධන වර්ගය (ඩීසල් /පෙට්‍රල්) | ඉන්ධන දැවීම (ලීටරයට කි.මී.) | ප්‍රතිපූරණය සඳහා ඉල්ලා සිටින මුදල | |
| | | | | | | | | රු. | ශත. |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

2015.08.17 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රධාන ගණන්කිරීමේ නිලධාරි / සහකාර භාරකාර නිලධාරි වශයෙන් සේවය කිරීම සඳහා මාගේ නිල වාහනය ............................... දිස්ත්‍රික්කයේ රාජකාරි සඳහා යාමට යොදාගත් බවත් එම ගමන වෙනුවෙන් ධාවනය වූ කි.මී ................. සඳහා රු. ......................... හා පෙට්‍රල් / ඩීසල් ලීටර් .......................... මගේ පෞද්ගලික මුදලින් ලබාගත් බවත් සහතික කරමි.එම මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාළ බිල්පත් සමඟ සම්පූර්ණ කරන ලද පොදු 35 ගෙවීම් වවුචරයක් මේ සමඟ එවා ඇත.

.............................................

නිලධරයාගේ අත්සන

නම සහිත නිල මුද්‍රාව තබන්න.

දිනය :.........................................